# දුම්රිය කෞතුකාගාරයට ගිය මගේ ගමන




අශ්මි මෙතුසරි බණ්ඩාර

# දුම්රිය කෞතුකාගාරයට ගිය මගේ ගමන



ප්‍රථම එළිදැක්වීම - 15.11.2023
ISBN 978-624-206-631-8

අශ්මි මෙතුසරි බණ්ඩාර



# පිදුම

ඉපදුන දා පටන් මා
ආදරයෙන් ගුරුහරුකම්
ලබාදුන් මාගේ ආදරණීය අම්මාටත්,
ආදරණීය තාත්තාටත්
මගේ නංගීටත්,
මෙතෙක් මා හට ඉගැන්වූ
සියලුම ගුරුමෑණිවරුන්ට හා
පියවරුන්ට ආදරයෙන් මේ
පොත පිරිනමමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

අත්තම්මාගේ ගෙදර තියෙන්නේ කඩුගන්නාවේ.
පාසල් නිවාඩු කාලයෙහි අපි අත්තම්මාගේ ගෙදර  යනවා.
කඩුගන්නාව හරි ලස්සන සුන්දර ගමක්,
දවසක් මම මගේ ට්‍රයිසිකලයෙන් ජාතික දුම්රිය කෞතුකාගාරයට ගියා.



මාගේ ට්‍රයිසිකල් සවාරිය අත්තම්මලාගේ ගෙදරින් පටන් ගත්තා. මගේ පුංචි බයිසිකලයෙන් සවාරිය ඇරඹුවා.









ටික වේලාවකින් අපි කඩුගන්නාව දුම්රිය ස්ථානයේ පිහිටි දුම්රිය කෞතුකාගාරය අසලට පැමිණියා. අපි මුදල් ගෙවා ප්‍රවේශ පත්‍ර ලබා ගත්තා.










දුම්රිය කෞතුකාගාරයේ සිටි නැන්දා මට එහි විස්තර කියා දුන්නා. බොහෝම පැරණි දුම්රිය උපකරණ සහ දුම්රිය මාර්ග වල භාවිත කළ උපකරණ ගැන විස්තර දැන ගැනීමට හැකි වුණා.










දුම්රියක් ගමන් කරන විට භාවිත කරන සංඥා සහ උපකරණ පිළිබඳ හොඳ අවබෝධයක් මට එහිදී ලබා දුන්නා. ඉතාමත් පැරණි, හිරු එළිය භාවිතා කර වේලාව බලන උපකරණයක් ද මට දැක ගන්නට ලැබුණා.















මට එහිදී දුම්රියක පාලන කුටියට ද පැමිණීමට හැකි වූවා. ඊට අමතරව ලංකාවේ දුම්රිය ඉතිහාසය පිළිබඳ කුඩා චිත්‍රපටියක් ද දැක ගැනීමට මට අවස්ථාව ලැබුණා.







ඉතාම පැරණි වාෂ්ප දුම්රියක ඇතුළත මට දැක ගැනීමට හැකි වුණා. එමෙන්ම දුම්රිය මාර්ගයේ ඇති විවිධ සංඥා උපකරණ ක්‍රියා කර බැලීමට ද හැකි වූවා.












මා හට දුම්රිය එන්ජිමක ඇතුළත පවා දැක ගැනීමට හැකි වුණා. එමෙන්ම දුම්රිය එන්ජිම ආශ්‍රිත විවිධ උපකරණත් දැක ගැනීමට හැකි වුණා.














**චාරිකාව අවසානයේ දී මට ශ්‍රී ලංකාවේ දුම්රිය ස්ථාන පිළිබඳ ලියැවුණු පොත් රාශියක් ද කියවීමට ලැබුණා. එම දැනුමත් සමඟ සමනලී චාරිකාව අවසන් කරමින් එම ස්ථානයෙන් පිට වූවා.**










කඩුගන්නාව දුම්රිය කෞතුකාගාරය අවට පිහිටි තවත් වැදගත් ස්ථාන කිහිපයක් ද මට දැක ගන්නට ලැබුණා. ඒවා අපගේ මහා මාර්ග ඉතිහාසයට අයිති බව මට දැන ගන්නට ලැබුණා.






කැප්ටන් ඩෝසන් කුළුණ





කඩුගන්නාව ගල් බිංගය

කඩුගන්නාව පැරණි අම්බලම







# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**